## 1.20 ජපානයේ කගුර ජන නාට්‍ය විශේෂය හා ශ්‍රී ලංකාවේ ගම්මඩු ශාන්තිකර්මය

කුලතිලක කුමාරසිංහ
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

ක්‍රි.ව. 6 වන සියවසේ සිට අද දක්වා ම රඟ දක්වනු ලබන ජන නාට්‍ය රැසක් ජපානයේ දැකිය හැකිය. ඒවා නම් කගුර, කගක, ගිගකු, බුගකු, සන්ගකු, සරුගකු, දෙන්ගකු හා ෆූර්යූ ය. මේවා අතුරින් කගුර, දෙන්ගකු හා ෆූර්යූ ජන නාට්‍ය තුන විශේෂ වැදගත්කමකින් යුක්තය.

ෂින්තෝ දෙවියන් පිදීම අරමුණු කර ගත් කගුර පූජනීය සංගීතයෙන් හා නර්තනයෙන් යුත් රංග විශේෂයකි. අත්‍යවශ්‍ය වූ අංගෝපාංග නම් ගී ගායනා, නැටුම් හා වැයුම්ය. මේ නාට්‍ය විශේෂයට සම්බන්ධවන නළුවෝ වෙස්මුහුණු පළඳිති. කගුර නාට්‍ය මයිකො හා කගුර ඕ යනුවෙන් ප්‍රධාන රංග දර්ශන දෙකකින් යුක්තය. එසේ ම මෙහි විවිධ ප්‍රභේද දක්නට පුළුවන. ඒවා අතර විශේෂයෙන් සඳහන් කළ යුතු ප්‍රභේද හතරකි. එනම් මිකො කගුර, ඉසෙ කගුර, ඉශුමො කගුර හා ෂිෂි කගුර ය. යමබුෂි කගුර යනුවෙන් හැඳින්වෙන කගුර ප්‍රභේදය ද විශේෂ වැදගත්කමකින් යුක්තය. සමස්තයක් වශයෙන් ගත් විට කගුර නාට්‍යය චාරිත්‍ර විධිවලින් යුක්තවන අතර ආගමික මුහුණුවරක් ගෙන ඇත.

මේ ජන නාට්‍ය විශේෂයට බොහෝ දුරට සමීපව යන දේශීය ශාන්තිකර්මයක් ලෙස ගම්මඩුව දැක්විය හැකිය. ඒ වූ කලී ගමට, ප්‍රදේශයට හා රටට සෙත් ශාන්තිය ආරක්ෂාව හා සෞභාග්‍යය ප්‍රාර්ථනය කර දෙවි දේවතාවුන් වෙනුවෙන් පවත්වනු ලබන පූජා කර්මයකි. ඒ අනුව මේ පූජාකර්ම දෙකේ ම අභිලාෂය බොහෝ දුරට සමානය. ගම්මඩු රඟ දක්වන්නේ ප්‍රධාන වශයෙන් පත්තිනි දෙවඟන පිදීම සඳහාය ගම්මඩුවට සමාන ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ යමබුෂි යනුවෙන් හැඳින්වෙන කගුර ගණයෙහිය. ගම්මඩුවට අයත් පන්තිස් කෝල්මුර මෙන් මෙහි ද දෙවි දේවතාවුන් සම්බන්ධ කතා පුවත්වලින් තෝරා ගත් සිදුවීම්, නැටුම්, ගැයුම්, වැයුම් මගින් රඟ දක්වනු ලැබේ. ගම්මඩුවේ දී රඟ දැක්වෙන පන්තිස් කෝල්මුර උපත, මරා ඉපැද්දීම, පත්තිනියගේ සැමියා වන පාලඟ කුමරු මැරුණු පසු නැවත පණ ලබා දීම හා රාම මැරීම යන ජවනිකාවලට බොහෝ දුරට සමාන පුවත් කගුර නාට්‍යවල දී ද රඟ දක්වනු ලැබේ.

බෙරය, තාලම්පට හා බටනලාව කගුරවල මූලික සංගීත භාණ්ඩ වේ. ගම්මඩුව ද බෙරය කේන්ද්‍ර කර ගත් සංගීත භාණ්ඩ අවස්ථාවෝචිත ලෙස භාවිත කරයි. කගුර හා ගම්මඩුවල දක්නට ලැබෙන මේ සමානත්වය සාමාන්‍ය ජනතාව අතුරෙන් පැන නැගුණු නාට්‍යවල දැකිය හැකි විශේෂත්වයක් ද යන්න විමසා බැලිය යුතුය.